මාතර ප්‍රාදේශීය සභාව,
<u>මාතර දිස්ත්‍රික්කය.</u>

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට මාතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ රු.107,477 ක් වූ ගබඩා ද්‍රව්‍ය අයිතම 38 ක වටිනාකම ගිණුම්වලින් අත්හැරී තිබීම සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරිමේදි නිවැරදි කරමි. |
| (ii) | ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු.74,838,385 ක් වූ උසාවි දඩ හා රු.32,588,636 ක මුද්දර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරිමේදි නිවැරදි කරමි. |
| (iii) | ඉකුත් වර්ෂය තුළ සහා අරමුදල් මඟින් නිම කර තිබූ කැකනදුර සතිපොලේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු.685,989 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරිමේදි නිවැරදි කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ එකතුව රු.348,156 ක් වටිනා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරිමේදි නිවැරදි කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැතියන් රු.287,925 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ණයගැතියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරිමේදි නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (vi) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු රු.563,373 ක් සඳහා වැඩිපුර ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරිමේදි නිවැරදි කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවියයුතු රු.154,161 ක් වූ විවිධ වියදම්, සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරිමේදි නිවැරදි කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ඇප තැන්පතු ශේෂය රු.40,057 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරිමේදි නිවැරදි කරමි. |
| (ix) | දැන්වීම් පුවරු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 17 දින ලැබුණු රු.60,000 ක චෙක්පතක් අගරු වී තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් ගිණුම්වලට ගැලපීම නොකර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බැංකු සැසඳුමෙහි උපලබ්ධි නොවූ චෙක්පත් වශයෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරිමේදි නිවැරදි කරමි. |

**(ආ) අසම්භාව්‍ය බැරකම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.2,704,750 ක් වූ සභාවේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට එරෙහිව අංක SPL 644 යටතේ පුද්ගලයෙකු විසින් දිසා අධිකරණයෙහි පවරා තිබූ නඩුව පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | 2019 මූල්‍ය ප්‍රකාශන වල සටහන් කරමි. |

(ඇ) **නොසැසඳු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.61,975,762 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.16,471,961 ක අසමානතා පැවතුණි.. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් ගිණුම් විෂයන් 06 ට අදාල ශේෂ හා උප ලේඛන වල ශේෂ නිවැරදි කිරිමට කටයුතු කරමි. |

(ඇ) **විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.171,453,555 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | විධිමත් පරිදි යාවත්කාලීන කර ලේඛණ පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබා දුනිමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුව හා දේපළ තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබද ලැයිස්තුව හා දේපල තහනම් කිරීමේ |

| | | | | |
|---|---|---|---|---|
| | (i) රීති 33 | පිළියෙල කර නොතිබුණි. | | වරෙන්තු ලැයිස්තු පිළියෙල කරමින් පවති. |
| | (ii) රීති 143 | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව එකතු කර ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජර ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ ගැලපීම් ඉදිරියේදි කර විගණනයට ඉදිරිපත් කරමි. |
| | (iii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි සකස් කර ඉදිරිපත් කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.237 | ගෙවීම් වවුචර් වලට අදාළ සියළුම උපලේඛන වවුචරයට ඇමිණිය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මු.රෙ 237 ප්‍රකාරව වවුචරයට සියලුම උප ලේඛන ඇමිණීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.29,052,831 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.36,726,325 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,490,330 | 6,288,696 | 4,257,985 | 7,762,653 | 5,409,360 | 6,660,213 | 4,957,467 | 5,731,942 |
| කුලී | 2,053,100 | 2,279,621 | 2,238,743 | 399,813 | 2,143,100 | 1,670,214 | 1,701,914 | 358,935 |
| බලපත්‍ර ගාස්තු | 1,195,100 | 3,189,741 | 3,189,741 | -- | 1,423,920 | 2,496,940 | 2,496,940 | -- |
| වෙනත් ආදායම් | 21,173,700 | 22,058,212 | 29,565,277 | 28,992,935 | 19,368,500 | 31,045,213 | 22,045,213 | 36,500,000 |
| **එකතුව** | 29,912,230 | 33,816,270 | 39,251,746 | 37,155,401 | 28,344,880 | 41,872,580 | 31,201,534 | 42,590,877 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.29,912,230 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.42,590,877 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.33,816,270 ක් සමඟ රු.76,407,147ක් අයවීමට තිබූ අතර වර්ෂය තුළදී මුළු අයවීම් රු.39,251,746 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.37,155,401 ක් විය. අයවීම් ප්‍රගතිය සියයට 51 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම අය කිරීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.5,717,367 ක් වූ අතර, රු.5,055,953 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සහ අධි ගාස්තු සමඟ රු.10,773,320 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.3,027,075 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.7,746,245 ක හිඟ ශේෂයක් පැවතුණි. මුළු අයවීම්, ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 28 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | 2019 ජුනි 01 වන දිනද ජංගම සේවයක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. |
| **(ආ) අක්කර බදු** | | |
| ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.14,575 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් (ගාස්තු හා දඩ සමඟ) රු.2,888 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.1,054 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.16,409 ක් හිඟව පැවතුණි. මුළු අයවීම්, ආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 06 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ලේඛණයේ පවතින ලිපිනයන් සහ හිමිකරුවන් නිවැරදි ව යාවත්කාලීන කර ගැනීම සඳහා සමීක්ෂණයක් කර තොරතුරු නිවැරදි කර ගත යුතු බවට ආදායම් කමිටුව දන්වා ඇත. |

### 2.2.4 කුලී ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟය රු.358,935 ක් වූ අතර, රු.1,382,610 ක් වූ වර්ෂයේ බිල්කිරීම් හා අධි ගාස්තු සමඟ රු.1,741,545 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.1,343,908 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.397,637 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මෙම හිඟ මුදල් දීර්ඝ කාලයක් තිස්සේ පවතින හිඟයක් වන අතර වර්ෂයට අදාල මුදල් නිසියාකාරව ලැබී ඇත. |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.8,992,935 ක් හා මුද්දර ගාස්තු රු.20,000,000 ක මුදලක් අයවිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගැනීම සඳහා ප්‍රධාන ලේකම් හා අනෙකුත් බලධාරින්ට ලිඛිතව හා වාචිකව ඉල්ලා සිටියද ප්‍රමාදයක් පවති. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධන ඇගයීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 23(ඇ) වගන්තිය යටතේ යම් අත්හිටුවීමකට හෝ අවලංගු කිරීමකට යටත්ව අවුරුදු 03 ක | පරිසර බලපත්‍ර අලුත් කළ යුතුවේ. | ව්‍යාපාරික ආයතන වලට අදාළව බලපත්‍රය වලංගු වන |

| | | |
|---|---|---|
| කාලයකට වැඩි නොවන පරිදි බලපත්‍රයේ නිශ්චිතව සඳහන් යම් කාලයක් සඳහා වලංගු විය යුතු වුවද වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ ව්‍යාපාර ආයතන 16 ක් පරිසර බලපත්‍ර අලුත් කර නොතිබුණි. | | වසර 03 ක කාලය අවසන් වුවත් නැවත බලපත්‍රය අළුත් කිරිමට කටයුතු කර නොමැත. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කරගැනීමට වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුවේ. | සභාවේ සකස් කරන ලද සිව් අවුරුදු සැලැස්ම තුලින් තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක පිළිබඳ අවධානය යොමු කර ඒවා ළගා කර ගැනීමට අවශ්‍ය විශේෂ වැඩසටහනක් සකස් කරමින් පවති. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අංක 2052 හා 2017 දෙසැම්බර් 29 දිනැති ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව 2019 මාර්තු 29 දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී සවිකර ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 34 ක් වෙනුවෙන් රු.2,526,100 ක ගාස්තු අයකර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අයකිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | පුද්ගලික සමාගමක් විසින් ප්‍රදර්ශනය කරන ලද බැනර් 30 ක් සඳහා 2019 මාර්තු 18 දින රු.24,750 ක් ගෙවීම්කර තිබූ අතර 2019 මාර්තු 29 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී කැකනදුර යටියන මාර්ගයේ පමණක් බැනර් 63 ක පුවරු ප්‍රදර්ශනය කර තිබූ අතර එම මාර්ගයෙන් පමණක් රු.64,350 ක් අයකල යුතු අතර අනෙකුත් මාර්ගවලද එම සමාගම විසින් ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු මඟින් ගාස්තු අයකර නොතිබුණි. | සියලුම දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකළ යුතුවේ. | අයකිරීමට කටයුතු කර ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 09 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 08 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | බර යන්ත්‍ර ක්‍රියාකරු බඳවා ගැනීමට කටයුතු සිදුකලද සුදුසුකම් සම්පූර්ණ කර ඇති කිසිවෙකු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී නොමැති බැවින් නැවත ගැසට් කිරිමට කටයුතු කර ඇත. ඉතිරි තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු සිදු කරමින් පවතී.<br><br>නිලධාරි අතිරික්තව සිටීම පිළිබඳව අංක මාර/පපාසකො/සං/2/1 ලිපිය මගින් සහකාර පළාත් පාලන කොමසාරිස්ට දන්වා යවා ඇත. |

### 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2007 මාර්තු 19 දිනැති අංක දපපා/15 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන සතු සෑම දේපලක්ම ආරක්ෂාව තහවුරු කර ගැටළු සහගත තත්ත්වයේ ඇති ඉඩම් මැන මායිම් නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | බිම් සවිය වැඩ සටහන යටතේ සභාව සතු ඉඩම් මැනීමේ කටයුතු සිදු කරනු ලබන අතර ප්‍රාදේශිය සභාව විසින්ද ඉඩම් මැනීමේ කටයුතු සිදු කෙරේ. |
| (ආ) | සභාව සතු ඉඩම් කැබලි 11 ක් පෞද්ගලික පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්තිවිදිමින් පැවතුණි. | අනවසර පදිංචිකරුවන් ඉවත් කළ යුතුවේ. | සභාවට ඉදිරිපත් කර ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 08 ක ඉතිරිවීම්වල එකතුව රු.16,432,842 ක් වූ අතර, එම අගයන් සියයට 7 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | පසුගිය වර්ෂ 05 ක සියළු ආදායම් වියදම් සැලකිල්ලට ගෙන අදාල පාර්ශවයන් ද සහභාගි කර ගෙන අය වැය ලේඛනය පිළියෙල කර ඇත. |
| (ආ) | ආදායම් විෂයයක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.8,033,187 ක් වූ අතර, එය සියයට 16 ක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | පසුගිය වර්ෂ 05 ක සියළු ආදායම් වියදම් සැලකිල්ලට ගෙන අදාල පාර්ශවයන් ද සහභාගි කර ගෙන අය |

| | | වැය ලේඛනය පිළියෙල කර ඇත. |
|---|---|---|

**4.2** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 රෙගුලාසිවල දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපති සමඟ සාකච්ඡා කර එකඟත්වය ලබාගෙන නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන කටයුතු ප්‍රමාණවත් පරිදි සිදු කර වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කිරීමට ඉදිරියේදි කටයුතු කරමි. |